267703

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2019

## පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2019 අගෝස්තු

# I පත්‍රය

**මිනිත්තු 45 යි.**

විභාග අංකය ....................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත ලියන්න.**
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40**ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු **තුන** බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**


| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කේත අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමුවන පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක** පළමුවන පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | V/I/S/CH |

(දෙවැනි පිටුව බලන්න


● අංක **1** සහ **2** ප්‍රශ්නවල කොටුව තුළ ඇති කාණ්ඩයට ඇතුළත් කිරීමට වඩාත් ගැළපෙන රූපය තෝරන්න.

**1.**



(1)  (2)  (3) 

**2.**



(1)  (2)  (3) 

Department of Examinations - Sri Lanka

● අංක **3** සහ **4** ප්‍රශ්නවල දී ඇති රූප නිරීක්ෂණය කර පිළිතුරු සපයන්න.

**3.**



A රූපය




B රූපය


A හා B රූප දෙක අතර ඇති වෙනස්කම් ගණන කීය ද?

(1) 1 (2) 2 (3) 3

**4.**



C රූපය




D රූපය


C හා D රූප දෙක අතර ඇති වෙනස්කම් ගණන

(1) හතරට අඩු ය. (2) හතරකි. (3) හතරට වැඩි ය.


**5.** පහත දැක්වෙන රටාව ඉදිරියට සම්පූර්ණ කිරීමේදී හයවැනි තැනට තැබිය යුතු කාඩ්පත කුමක් ද?



1



2




3

4


5

?


6



(1)



(2)




(3)

(තුන්වැනි පිටුව බලන්න

විභාග අංකය: ....................................

**6.** පහත දී ඇති රූපවල ඉරටු කැබලි තුන බැගින් ඇත.
ඒවායේ මුළු දිග ඒ අයුරින්ම භාවිත කර ත්‍රිකෝණයක් සැකසිය හැකි ඉරටු කැබලි ඇති රූපය කුමක් ද?



(1) (2) (3)


**7.** මෙම ප්‍රශ්න පත්‍රයේ මුල් පිටුවෙහි දී ඇති තොරතුරුවලට අනුව නිවැරදි ප්‍රකාශය කුමක් ද?


(1) විභාග අංකය ස්ථාන දෙකක ලිවිය යුතු අතර පිළිතුරු සැපයීමට ලබාදෙන කාලය පැයකට අඩු ය.

(2) විභාග අංකය ස්ථාන දෙකක ලිවිය යුතු අතර පිළිතුරු සැපයීමට ලබාදෙන කාලය පැයකට වැඩි ය.

(3) විභාග අංකය ස්ථාන තුනක ලිවිය යුතු අතර පිළිතුරු සැපයීමට ලබාදෙන කාලය පැයකට අඩු ය.

**8.** පොතක පිටු දෙකක අකුරු යම් ආකාරයකට යොදා ඇති අයුරු රූපයේ දැක්වේ.
එය හඳුනාගෙන ඒ අනුව ම අකුරු යොදා ඇති පිටු දැක්වෙන රූපය තෝරන්න.






(1) (2) (3)

● පහත කවිය කියවා, අංක **9** සහ **10** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පොත් කියවන සැම දෙනා
නව දැනුමෙන් පිබිදෙනා
අලුත් අලුත් දේ තනා
ලොව බැබළෙයි තරු මෙනා

**9.** මෙම කවියේ **සමස්ත** අදහසින් පැවසෙන්නේ,

(1) පොත් කියවීමේ අගය පිළිබඳව ය.

(2) තරු ලොවේ බැබළීම පිළිබඳව ය.

(3) අලුත් අලුත් දේ නිර්මාණය පිළිබඳව ය.

**10.** කවියෙහි දැක්වෙන අදහස් කිහිපයක් නිවැරදි අනුපිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) අලුත් දැනුම ලබා ගැනීම ⟶ පොත් කියවීම ⟶ අලුත් අලුත් දේ නිර්මාණය කිරීම

(2) පොත් කියවීම ⟶ අලුත් අලුත් දේ නිර්මාණය කිරීම ⟶ අලුත් දැනුම ලබා ගැනීම

(3) පොත් කියවීම ⟶ අලුත් දැනුම ලබා ගැනීම ⟶ අලුත් අලුත් දේ නිර්මාණය කිරීම

**11.** අඳුරෙදි නැති - එළියෙදි ඇති
මට ම හිතැති - මගේ ම සකි
මෙයින් කියැවෙන්නේ,

(1) හිතමිතුරා ගැන ය. (2) සෙවනැල්ල ගැන ය. (3) හිරු ගැන ය.

Department of Examinations - Sri Lanka

(හතරවැනි පිටුව බලන්න

- පහත දැක්වෙන්නේ කතන්දරයක කොටසකි. එහි හිස්තැන්වලට ගැළපෙන වචන ඇතුළත් කොටස තෝරන්න.

**12.** පැණි කුරුල්ලා සහ මී මැස්සා කැලේ සිටිය අඹ යහළුවෝ දෙන්නෙක්. දවසක් ගඟ ළඟ ...... අත්තක් උඩ සිටි පැණි කුරුල්ලා දැක්කා යාළුවා වතුරේ ගසාගෙන යන බව. ...... ඉක්මනට හොටෙන් ගසේ කොළයක් කඩා ගත්තා. එය මී මැස්සා ළඟට දැම්මා. ...... වතුරට දැමූ කොළය මතට ගොඩවුණා. තටු වේලාගෙන ටික වෙලාවකින් ඉගිල ගියා.

(1) ගසක / මී මැස්සා / පැණි කුරුල්ලා

(2) ඉවුරේ / පැණි කුරුල්ලා / මී මැස්සා

(3) ගසක / පැණි කුරුල්ලා / මී මැස්සා

- පහත දැක්වෙන සටහන බලන්න.

| | පළමුවන තීරය ↓ | දෙවන තීරය ↓ | තුන්වන තීරය ↓ |
|---|---|---|---|
| පළමුවන පේළිය → | A | B | C |
| දෙවන පේළිය → | F | E | D |
| තුන්වන පේළිය → | G | H | I |

පියවර 1 හි හා 2 හි සඳහන් ආකාරයට සටහන වෙනස් කරනු ලැබේ. ඒ ඇසුරින් අංක **13** සහ **14** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පියවර 1 - පළමුවන පේළිය තිබෙන තැනට දෙවන පේළියත් දෙවන පේළිය තිබූ තැනට පළමුවන පේළියත් මාරු කිරීම

පියවර 2 - දෙවන තීරය තිබෙන තැනට තුන්වන තීරයත් තුන්වන තීරය තිබූ තැනට දෙවන තීරයත් මාරු කිරීම


**13.** වෙනස් කිරීම්වලින් පසු රූපයේ මැද කොටුවේ පිහිටන අකුර කුමක් ද?


(1) B (2) C (3) D


**14.** මුල් රූපයේ I අකුර තිබූ තැනට වෙනස් කිරීම්වලින් පසු පැමිණි අකුර කුමක් ද?


(1) H (2) G (3) D

**15.** රූපයේ හිස්තැනට ගැළපෙන කොටස තෝරන්න.




(1)


(2)


(3)

Department of Examinations - Sri Lanka

(පස්වැනි පිටුව බලන්න

16. ✱ සංකේතය දෙවරක් ද ☆ සංකේතය එක්වරක් ද යොදාගෙන 343 යන සංඛ්‍යාව ලියා තිබුණි. 343ට 100 ක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාව දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) ✱ ✱ ☆ (2) ☆ ☆ ✱ (3) ☆ ✱ ☆


17. A කඩදාසි පටිය | △ | ○ | # | □ | B කඩදාසි පටිය | ⊕ | ✡ |



A කඩදාසි පටියෙහි ඇති # සලකුණ මත B කඩදාසි පටියෙහි ඇති ✡ සලකුණ පිහිටන සේ A කඩදාසි පටිය මත B කඩදාසි පටිය තැබූ විට දැකිය හැකි රූපය කුමක් ද?

(1) | △ | ⊕ | ✡ | □ | (2) | △ | ○ | ✡ | □ | (3) | ⊕ | ✡ | # | □ |


● අංක 18 සහ 19 ප්‍රශ්නවල හිස් කොටුවට ගැළපෙන රූපය තෝරන්න.

18.



(1)  (2)  (3) 

19.



(1)  (2)  (3) 

20. සුනිල් ඉනිමගක හතරවන ලී පටිය මත සිටියි. තව ලී පටි තුනක් ඉහළට නැග්ග විට ඔහුට ඉනිමගේ හරි මැද ලී පටිය මතට පැමිණිය හැකි ය. ඉනිමගේ ඇති මුළු ලී පටි ගණන කීය ද?

(1) 10 (2) 13 (3) 14

21. ළමයෙක් තවත් ළමයින් හතරදෙනකු ගඟකින් එගොඩට ගෙන ගොස් ඔවුන් සියලු දෙනා ම එහි සිටි ළමයා ළඟ නතර කර, නැවත මෙගොඩට පැමිණ තවත් ළමයින් තිදෙනකු සමග එගොඩ සිටි ළමයින් ළඟට ගියේ ය. දැන් එගොඩ සිටින මුළු ළමයින් සංඛ්‍යාව කීය ද?

(1) 7 (2) 8 (3) 9


22. නිමල් උපදින විට ඔහුගේ මවගේ වයස අවුරුදු 25 කි. නිමල්ගේ මල්ලී උපදින විට මවගේ වයස අවුරුදු 29 කි. නිමල්ගේ දැන් වයස අවුරුදු 10 නම් ඔහුගේ මල්ලීගේ දැන් වයස අවුරුදු කීය ද?

(1) 4 (2) 5 (3) 6

23. "දින පහ ම පාසල පැවැත් වූ සතියක එක ළඟ දින තුනක් ම සමන්ට පාසල් පැමිණීමට නොහැකි විය." මෙම ප්‍රකාශය අනුව සමන් නිසැකව ම පාසල් **නොපැමිණි** දවස වනුයේ,


(1) බදාදා ය. (2) බ්‍රහස්පතින්දා ය. (3) සිකුරාදා ය.

Department of Examinations - Sri Lanka

**24.** 

මෙම රූපය තද ඉරි දිගේ ● සලකුණු පිටතට සිටින සේ නමා චතුස්තලයක් සාදා ගන්නා ලදී. එම චතුස්තලය දැක්වෙන රූපය තෝරන්න.

(1)   (2)   (3) 


**25.** 

මෙම රූපයෙහි දැකිය හැකි සමචතුරස්‍ර සංඛ්‍යාව කීය ද?

(1) 2  (2) 8  (3) 10

**26.** පුද්ගලයින් තිදෙනකුගේ නම් ඉංග්‍රීසි අකුරු යොදා සංකේතාත්මකව BEAT, NEAT සහ SEAT ලෙස ලියා තිබුණි. මොවුන් තිදෙනාගේ නම් නිවැරදිව ලියා ඇති පිළිතුර කුමක් ද?

(1) සුනිමල්, සිරිමල්, දුනිමල්  (2) ධනපාල, ඥානපාල, දිනපාල  (3) පියසිරි, ජයසිරි, දයාසිරි


**27.** 

රූපයේ දැක්වෙන තරාදි සමබරව පවතී. ඒ අනුව ■ ට සමාන වනුයේ,

(1) ▲●  (2) ▲▲  (3) ▲▲●

**28.** A රූපය තුළ B රූපයේ හැඩයේ විවිධ පිහිටීම් කීයක් දැකිය හැකි ද?

A රූපය



B රූපය



(1) 6  (2) 3  (3) 1

**29.** දැනුම මිනුම තරගයකදී ප්‍රශ්න පහක් ලැබේ. පළමුවන ප්‍රශ්නයට ලකුණු 1 ක් ද දෙවන ප්‍රශ්නයට ලකුණු 2 ක් ද තුන්වන ප්‍රශ්නයට ලකුණු 3 ක් ද හතරවන ප්‍රශ්නයට ලකුණු 4 ක් ද පස්වන ප්‍රශ්නයට ලකුණු 5 ක් ද පිරිනැමේ. ලකුණු 13 ක් ලබාගත් ශිෂ්‍යයකුට නිවැරදිව පිළිතුරු සැපයීමට **නොහැකි** වූයේ කීවෙනි ප්‍රශ්නයට ද?

(1) පළමුවන  (2) දෙවන  (3) තුන්වන

**30.** “මට ඉන්නේ අයියා කෙනෙකුයි අක්කා කෙනෙකුයි විතරයි. අපේ අම්මාට පුතෙකුයි දුවලා දෙන්නෙකුයි ඉන්නවා.” යනුවෙන් ළමයෙක් ප්‍රකාශ කරයි.

ඒ අනුව, මෙම ළමයා එම පවුලේ


(1) වැඩිමහල් දියණිය වේ.

(2) බාල දියණිය වේ.

(3) බාල පුතණුවන් වේ.

Department of Examinations - Sri Lanka

**31.** සතුන්, පක්ෂීන්, මයිනා සහ හාවා අතර සම්බන්ධතාව පහත රූපයෙන් දැක්වේ.



 මගින් නිරූපණය වන්නේ,

(1) හාවා ය. (2) මයිනා ය. (3) පක්ෂීන් ය.

**32.** සිද්ධියක අවස්ථා තුනක් නිවැරදි අනුපිළිවෙළින් ලියා ඇති ආකාරය දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) තේරුම් ගනියි ⟶ පාඩම කියවයි ⟶ පැහැදිලි කරයි
(2) දොර වසයි ⟶ අගුල දමයි ⟶ නින්දට යයි
(3) සුළඟ හමයි ⟶ සිසිල දැනෙයි ⟶ උණුසුම අඩු වෙයි

**33.** වත්තක ඇති අඹ, පේර හා රඹුටන් ගස් සංඛ්‍යාව එකිනෙකට සමාන ය. එහි ඇති පොල් ගස් සංඛ්‍යාව අඹ, පේර හා රඹුටන් ගස් සංඛ්‍යාවේ එකතුවට සමාන ය. එම තොරතුරු ප්‍රමාණාත්මකව දක්වා ඇති සටහන තෝරන්න.

| | |
|---|---|
| පොල් | රඹුටන් |
| පේර | අඹ |

(1)

| | | |
|---|---|---|
| අඹ | පේර | රඹුටන් |
| පොල් | | |

(2)

| | | |
|---|---|---|
| පොල් | | |
| අඹ | පේර | රඹුටන් |

(3)


**34.** පන්තියක සිටින ගැහැනු ළමයින් සංඛ්‍යාවේ හා පිරිමි ළමයින් සංඛ්‍යාවේ එකතුව එම පන්තියේ සිටින පිරිමි ළමයින් සංඛ්‍යාව මෙන් දෙගුණයකි. මේ අනුව නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) පිරිමි ළමයින් සංඛ්‍යාවට වඩා ගැහැනු ළමයින් සංඛ්‍යාව වැඩි ය.
(2) ගැහැනු ළමයින් සංඛ්‍යාවට වඩා පිරිමි ළමයින් සංඛ්‍යාව වැඩි ය.
(3) පිරිමි ළමයින් සංඛ්‍යාවත් ගැහැනු ළමයින් සංඛ්‍යාවත් සමාන ය.

**35.** සමතලා බිමක නිමල්, විමල්ට මීටර 20ක් නැගෙනහිර දිශාවෙන් සිටියි. නිමල් දෙසට විමල් ගමන් අරඹන මොහොතේ ම නිමල්, විමල්ගේ වේගය මෙන් දෙගුණයක වේගයකින් නැගෙනහිර දිශාවට ම ගමන් කරයි. විමල් මීටර 10ක දුරක් නිමල් දෙසට ගමන් කළ විට දෙදෙනා අතර දුර මීටර කීය ද?

(1) 10 (2) 20 (3) 30


**36.** පහත දැක්වෙන රූපයේ සංඛ්‍යා රටාව අනුව [?] කොටුවට ගැළපෙන සංඛ්‍යාව තෝරන්න.




(1) 4 (2) 6 (3) 8

Department of Examinations - Sri Lanka


(අටවැනි පිටුව බලන්න

**37.** 

රූපයේ දැක්වෙන්නේ සමාන ලී කුට්ටි සමූහයක් යොදාගෙන කර ඇති ගොඩනැගීමකි. මෙම ගොඩනැගීම සඳහා යොදාගෙන ඇති මුළු ලී කුට්ටි ගණන කීය ද?

(1) 6 (2) 8 (3) 10


**38.** විවිධ ජල පරිමා සහිත සමාන භාජන තුනක් පහත දැක්වේ.




භාජන තුනේම ඇති ජල පරිමා සමාන කිරීමට අනුගමනය කළ හැකි **ඉක්මන් හා පහසු ම** ක්‍රියාමාර්ගය කුමක් ද?

(1) A භාජනයෙන් C භාජනයට ජලය දමා භාජන දෙකේම ජල පරිමා සමාන කිරීම
(2) C භාජනයේ ජල පරිමාවට සමාන වන පරිදි A හා B භාජනවලින් ජලය ඉවත් කිරීම
(3) භාජන තුනේ ම ඇති ජලය විශාල භාජනයකට දමා නැවත A, B හා C භාජන තුනට සමානව දැමීම

- පාසල් බිමක දළ සැලැස්මක් පහත දැක්වේ. ඒ ඇසුරින් අංක **39** සහ **40** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




**39.** ඉහත සැලැස්ම අනුව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ප්‍රධාන දොරටුවට උතුරෙන් පුස්තකාලයත්, ප්‍රධාන ශාලාවට බටහිරෙන් ක්‍රීඩාපිටියත් පිහිටා ඇත.
(2) කාර්යාලයට දකුණෙන් ප්‍රධාන ශාලාවත් ප්‍රධාන ශාලාවට නැගෙනහිරෙන් පුස්තකාලයත් පිහිටා ඇත.
(3) ක්‍රීඩාපිටියට බටහිරෙන් ප්‍රධාන දොරටුවත් ආපනශාලාවට නැගෙනහිරෙන් කාර්යාලයත් පිහිටා ඇත.

**40.** මෙහි ඇති ප්‍රධාන ශාලාවේ සිට පුස්තකාලයට ගමන් කරන අයකුට ඔහුගේ දකුණු අත පැත්තෙන් පළමුවෙන් ම දැකිය හැක්කේ,

(1) ක්‍රීඩාපිටියයි. (2) ප්‍රධාන දොරටුවයි. (3) කාර්යාලයයි.

***

Department of Examinations - Sri Lanka

# පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස් වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2019 අගෝස්තු

## I පත්‍රය

## උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා උපදෙස් සහ ලකුණු දීමේ පටිපාටිය

### 1. උත්තර පත්‍ර ලකුණු කිරීමේ දී සැලකිය යුතු කරුණු

1.1 සැම ප්‍රශ්නයක ම නිවැරදි ප්‍රතිචාරයක් සඳහා "✓ " ලකුණ ද, වැරදි ප්‍රතිචාරයක් සඳහා "× " ලකුණ ද, පිටුවෙහි ප්‍රධාන කොටුවෙන් පිටත දකුණුපස තීරයෙහි පැහැදිලි ව සටහන් කරන්න.

1.2 එක් එක් පිටුවේ නිවැරදි පිළිතුරු සඳහා වූ "✓ " ලකුණුවල එකතුව එම පිටුවේ දකුණුපස පහළ කෙළවරේ ඇති **කොටුව තුළ අංක දෙකකින් සටහන් කරන්න.**

1.3 එක් එක් පිටුවේ සටහන් කළ "✓ " ලකුණුවල එකතුව මුල් පිටුවේ අදාළ පිටු අංකයට ඉදිරියෙන් ඇති කොටුව තුළ සටහන් කරන්න.

1.4 මුළු "✓ " ලකුණුවල එකතුව අවසාන ලකුණ යටතේ ඉලක්කමෙන් සහ අකුරෙන් අදාළ කොටු තුළ ලියන්න.

1.5 යම්කිසි ප්‍රශ්නයකට පිළිතුරු දී නොමැති විට වරණ තුනම යටින් රතුපාටින් ඉරක් ඇඳ වැරදි "× " ලකුණ යොදන්න.

### 2. ලකුණු ලැයිස්තු සකස් කිරීමේ දී සැලකිය යුතු කරුණු

2.1 ලකුණු ලැයිස්තුවේ "Total marks" තීරුව ලකුණු ඇතුළත් කිරීම සඳහා භාවිත කරන්න.

2.2 එම තීරුවේ එක් එක් අපේක්ෂකයාගේ විභාග අංකය ඉදිරියේ, ඊට නියමිත උත්තර පත්‍රයේ සඳහන් අවසාන ලකුණ සටහන් කරන්න.

2.3 අවසාන ලකුණ ඉදිරියෙන් තීරු දෙකක් ඉතිරි කර, එය අකුරෙන් පැහැදිලි ව ලියන්න.

2.4 ලකුණු ලැයිස්තුව සකස් කිරීමේ දී යම් වරදක් සිදුවුවහොත්, එය පැහැදිලි ව **තනි ඉරකින් කපා** ඊළඟ තීරයේ නැවත ලියා ලකුණු ඇතුළත් කළ හා පරීක්ෂා කළ පරීක්ෂකවරුන් දෙදෙනාගේ කෙටි අත්සන් යොදන්න.

2.5 කිසියම් සංශෝධනයක් කරනු ලැබුවහොත්, පළමු වන හා දෙවන පරීක්ෂකවරුන්ගේ කෙටි අත්සන් යොදා එය සනාථ කරන්න.

2.6 සංශෝධනයක් කරනු ලබන සෑම අවස්ථාවක දීම ලකුණු ලැයිස්තුවත් පිළිතුරු පත්‍රයත් ප්‍රධාන පරීක්ෂකට පෙන්වා ඔහුගේ/ඇයගේ අත්සන ද ලබා ගන්න.





2.7 සෑම සංශෝධනයක් ම, ලකුණු ලැයිස්තුවේ පසුපිටෙහි "වෙනත් කරුණු" සඳහා වෙන් ව ඇති ස්ථානයේ ද සටහන් කර පරීක්ෂකවරුන් දෙදෙනාගේ ම සම්පූර්ණ අත්සන් යොදන්න.

2.8 සෑම ලකුණු ලැයිස්තුවක් ම ප්‍රධාන පරීක්ෂක, ලකුණු ඇතුළත් කළ, පරීක්ෂා කළ සහ ඇගයීම් ලකුණු තහවුරු කළ පරීක්ෂක (EMF) විසින් ස්වකීය සංකේත අංක සහ අත්සන් යොදා සහතික කර තිබීම අනිවාර්ය වේ.

Department of Examinations - Sri Lanka

**විශේෂ උපදෙස් :-** ප්‍රශ්නවල නිවැරදි පිළිතුරුට හිමි අංකය හෝ පිළිතුරේ කොටසක් හෝ යටින් ඉරක් ඇඳ හෝ රවුම් කර හෝ සලකුණු කර ඇති විට එය නිවැරදි පිළිතුරක් ලෙස සලකන්න.පිළිතුර ලියා තිබීම නිවැරදි සේ නොසැලකේ.

# I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | පිළිතුර |
|---|---|---|
| 1. | (3) |  |
| 2. | (2) |  |
| 3. | (3) | 3 |
| 4. | (2) | හතරකි |
| 5. | (2) |  |
| 6. | (1) |  |
| 7. | (1) | විභාග අංකය ස්ථාන දෙකක ලිවිය යුතු අතර පිළිතුරු සැපයීමට ලබාදෙන කාලය පැයකට අඩු ය. |
| 8. | (3) |   |
| 9. | (1) | පොත් කියවීමේ අගය පිළිබඳව ය. |
| 10. | (3) | පොත් කියවීම ⟶ අලුත් දැනුම ලබා ගැනීම ⟶ අලුත් අලුත් දේ නිර්මාණය කිරීම |
| 11. | (2) | සෙවනැල්ල ගැන ය. |
| 12. | (3) |   |
| 13. | (2) | C |
| 14. | (1) | H |
| 15. | (1) |  |
| 16. | (2) | ☆ ☆ ✱ |
| 17. | (1) |  |

Department of Examinations - Sri Lanka

| | | |
|---|---|---|
| 18. | (3) |  |
| 19. | (1) |  |
| 20. | (2) | 13 |
| 21. | (3) | 9 |
| 22. | (3) | 6 |
| 23. | (1) | බදාදා ය. |
| 24. | (1) |  |
| 25. | (3) | 10 |
| 26. | (2) | ධනපාල, ඥානපාල, දිනපාල |
| 27. | (2) |  |
| 28. | (1) | 6 |
| 29. | (2) | දෙවන |
| 30. | (2) | බාල දියණිය වේ. |
| 31. | (1) | හාවා ය. |
| 32. | (2) | දොර වසයි ⟶ අගුල දමයි ⟶ නින්දට යයි |
| 33. | (2) | අඹ පේර රඹුටන්<br>පොල් |
| 34. | (3) | පිරිමි ළමයින් සංඛ්‍යාවත් ගැහැනු ළමයින් සංඛ්‍යාවත් සමාන ය. |
| 35. | (3) | 30 |
| 36. | (2) | 6 |
| 37. | (3) | 10 |
| 38. | (1) | A භාජනයෙන් C භාජනයට ජලය දමා භාජන දෙකේම ජල පරිමා සමාන කිරීම |
| 39. | (2) | කාර්යාලයට දකුණෙන් ප්‍රධාන ශාලාවත් ප්‍රධාන ශාලාවට නැගෙනහිරෙන් පුස්තකාලයත් පිහිටා ඇත. |
| 40. | (1) | ක්‍රීඩාපිටියයි. |

Department of Examinations - Sri Lanka